282874

OL/2025(2026)/21/S-III

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 S III**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

| | | |
|---|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය III | | පැය දෙකයි |
| சிங்களமொழியும் இலக்கியமும் III | | இரண்டு மணித்தியாலம் |
| Sinhala Language and Literature III | | Two hours |

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

**වැදගත් :** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.
* **1, 2, 3, 4** ප්‍රශ්නවලටත්, **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න**.

(i) කඳු බැවුමක දං - බෝවිටි පඳුරු  ත ළා
පහළට ඇදී පර මල් පෙති ඉවත  නො ළා
**කලදෝ දියෙන් පොගවා රන් පුලින**  ත ලා
සංගීතවත් වී යමි ඉදිරියට  ග ලා

(අ) මේ පද්‍යය ඇතුළත් කාව්‍ය නිර්මාණයේ නම ලියන්න.
(ආ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ අදහස කුමක් ද?

(ii) "නිවෙසේ දී නැවත වරක් තම රූප සෞන්දර්යය ආස්වාදනය කිරීමේ අටියෙන් කැටපත ඉදිරියට ගිය ඇ, තම පොරෝනය ඉවත් කළා ය. එකෙණෙහි ම ඈ මහ හඬක් නැඟුවා ය."

(අ) මෙහි සඳහන් තැනැත්තිය මහ හඬක් නැඟීමට හේතුව කුමක් ද?
(ආ) මේ උද්ධෘතය ඇතුළත් නිර්මාණයේ කතුවරයා නම් කරන්න.

(iii) පහත දැක්වෙන කවියේ ඉතිරි පද **දෙක** සම්පූර්ණ කරන්න.

අග පිපි මල් මලිගිය ලිය  කැලේයා
වග බැඳ හෙන රජ හස පුල්  විලේයා

(අ) ..............................................................................................
(ආ) ..............................................................................................

(iv) "එසේ හෙයින් කල් නොයවා යහපත් නැකැතෙකින් වහා නික්මුණු මැනැවැ."

(අ) මේ ප්‍රකාශය කළේ කවරෙක් ද?
(ආ) උක්ත ප්‍රකාශයෙන් අනතුරුව ඔවුන් නික්ම ගියේ කුමක් සඳහා ද?

(v) "හිර ගෙදරින් අහපුවාම, උඹට දැන ගන්ඩ පුළුවන් වෙයි."

(අ) මේ ප්‍රකාශය කළේ කවරෙක් ද?
(ආ) මෙහි '**දැන ගන්ඩ පුළුවන් වෙයි.**' යනුවෙන් ප්‍රකාශ වන්නේ කුමක් ගැන ද?

(vi) මිහ'ඹ මුව මඬල මෙන් දිලෙන හැම  විට
දුලබ ඉසුරු පිරි සැදි ඒ වෙහෙර  සිට
කිරඹ පොකුරු මී රස ලැබ බොන  ලෙසට
නරඹ මිතුර තගෙ නෙත සිත සතුටු  කොට

(අ) මෙහි සඳහන් වන වෙහෙර හැඳින්වූයේ කුමන නමකින් ද?
(ආ) '**මිහිකත**' යන්න සඳහා මෙහි යෙදී ඇති වචනය කුමක් ද?

[දෙවැනි පිටුව බලන්න.

Download all Past papers >> https://bookbeekid.com/resource/past-papers/

(vii) රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩ ගිනි නැද්ද
**මිණි බරණින් සැදු මුත් ගත නොදිරද්ද**
පැණිවරකා ගසටත් හෙණ නොවදිද්ද

(අ) තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය ලියන්න.
(ආ) යහපත් දෙයකට වුවත් අයහපතක් සිදු විය හැකි බව ඇඟවෙන පද්‍ය පාදය උපුටා දක්වන්න.

(viii) "ම දුව විකුණන්නා නැත. රන් හැර ගෙන නො දෙමි. අපටත් රක්ෂාව නම් ඌ ම වෙ ද?"
(අ) මේ ප්‍රකාශය කළේ කවරකු ද?
(ආ) මේ ප්‍රකාශය ඇතුළත් කෘතිය අයත් වන්නේ කුමන යුගයකට ද?

(ix) "මහත් වූ කෝලාහල ශබ්දයෙක, අපි කුමක් බවත් නො දනුම්හ. 'කුමන අරගලයෙක් දැ' යි විමසුව හොත් යහපතැ"
(අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ආ) මෙහි සඳහන් පරිදි මහත් වූ කෝලාහල ශබ්දයක් ඇති වීමට හේතුව කුමක් ද?

(x) (අ) පැරණි ම සිංහල සිවුපද කාව්‍ය ග්‍රන්ථ ලෙස සැලකෙන සන්දේශ කෘති **දෙක** නම් කරන්න.
(ආ) **'පූජාවලිය'** කෘතියේ කතුවරයා කවරෙක් ද?

(ලකුණු 02 × 10 = 20 යි.)

**2.** පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) සිදු වූ පුවත අනාවරණය කරන ලෙසා
දෙදෙනා කැඳවා ගෙන කීවා තතු මෙලෙසා

(අ) මෙහි සඳහන් දෙදෙනා හැඳින්වූයේ කවර නම්වලින් ද?
(ආ) මෙහිදී අනාවරණය කෙරුණු පුවත කෙටියෙන් විස්තර කරන්න.

(ii) "කනක රජතාදීන් විචිත්‍ර වූ රක්ත නීලාදි වූ නානා වස්ත්‍රයෙන් සමුජ්වලිත රථාදියෙහි නඟන ලද නා නා ප්‍රකාර **ධවලච්ඡත්‍ර** පංක්තියෙන් ගැවැසී ගත්තී ය. ඇත් වාහන, අස් වාහන රථ වාහනයෙන් යුක්ත ය. හස්ති ශිල්ප යැ, අශ්ව ශිල්ප යැ, රථ ශිල්ප යැ, ධනුශ්ශිල්ප යැ ආදි වූ අටළොස් මහා ශිල්පයෙහි කෙළ පැමිණියන් විසින් විශේෂයෙන් **සමෘද්ධ ය**. මේ සේනා තොමෝ සිංහ සමාන වික්‍රම ඇත්තී ය."

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.
(ආ) යුද්ධ සේනාව වර්ණනා කර ඇති ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(iii) පිය සන් නො ව බිගු දැල් රැඳි කොපුලී
අවසන් නො ව වෙණ නදට ම **කුහුලී**
මද සන් සුන් පියොවින් සිටි නොසැලී
ගජ සෙන් සිතියම් ගජ සිරි **කියෙලී**

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.
(ආ) වීණා නාදයට ලොල් වූ ඇතුන්ගේ හැසිරීම් රටාව කෙටියෙන් විස්තර කරන්න.

(iv) නිල තුරඟුට නැඟෙමින් රිවි දෙව් සිරින
**දුල කැරැ** සේසත් මිණි බරණ **කිරණින**
බල පිරි සෙන් සහ යාපා පටුන් ගෙන
බල සේනානායක සපු කුමරු එන

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.
(ආ) මුළු පද්‍යයේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

[තුන්වැනි පිටුව බලන්න.

Download all Past papers >> https://bookbeekid.com/resource/past-papers/
0007353

**19.** සදුලි විජේනායක ශිෂ්‍යාව **අතීතාවර්ජනයක** නිරත වූවා ය.
(1) අතීතය අමතක කිරීමක (2) අතීතයට ගමන් කිරීමක
(3) අතීතය ගැන මතක් කිරීමක (4) අතීතයේ ජීවත් වීමක

**20.** දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නොපවතින** පද පේළිය තෝරන්න.
(1) අල්මාරිය, පෙට්ටිය, ලාච්චුව, පුටුව (2) ඉරිපන්දම්, හඳුන්කූරු, පහන්, කපුරු
(3) පොල්, ලූණු, දුරු, මිරිස් (4) කොට්ටය, ඇඳ , මෙට්ටය, ඇතිරිල්ල

**21.** එක් එක් පද පේළියේ දී ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | දේව - සුර, | භෝජන - ආහාර, | මුහුද - ජලාශය, | වාහනය - රථය |
| (2) | නර - මිනිසා, | සවන - කන, | නේත්‍ර - නයන, | නගරය - නුවර |
| (3) | වාලුකා - වැලි, | ගෙය - ගෘහය, | භාග්‍යය - දුක, | තරුණ - යෞවන |
| (4) | ප්‍රාසාදය - පහය, | සත්‍යය - ඇත්ත, | දිනය - වර්ෂය, | කුඹුර - ක්ෂේත්‍රය |

**22.** මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) කාලය - වේලාව, කල, නිමේෂය, දහවල
(2) ශරීරය - දේහය, සිරුර, කය, ඇඟ
(3) කුරුල්ලා - ශකුන, පක්ෂියා, විහඟ, දද
(4) හස්ති - ගජ, වරණ, ඇතා, ගිජිඳු

**23.** **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.
(1) විමල - නිමල (2) ආදර - අනාදර
(3) එල - අඑල (4) හුරු - නුහුරු

**24.** **වැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) 'නුඹ' යනු මධ්‍යම පුරුෂ බහු වචනයකි.
(2) 'ඝ' යන්න මූර්ධජ අක්ෂරයකි.
(3) 'බලමි' යන්න වර්තමාන කාල, උත්තම පුරුෂ, ඒක වචනයකි.
(4) 'බලවත්' යන්න තද්ධිත පදයකි.

**25.** පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍යය තෝරන්න.
(1) සාහිත්‍ය නිර්මාණයක් පදනම් වී වස්තු බීජයක් ඇති කෙරේ.
(2) යුද්ධයක් නිසා දේශපාලන ලෝකයේ ස්ථාවරත්වයට හේතු වේ.
(3) සතුරන්ගේ ආක්‍රමණවලට අප උපක්‍රමශීලී විය යුතු ය.
(4) තොරතුරු යාවත්කාලීන කිරීම රටක ප්‍රගමනයට උපකාරී වෙයි.

● අංක **26, 27** ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

**26.** තිබෙන දෙයටත් වඩා අයහපත් දෙයක් ළං කර ගැනීම
(1) කන්න දුන්න අත හපා කෑව වගේ.
(2) ඉස්සෙල්ලා ආපු කනට වඩා පස්සෙ ආපු අඟ ලොකු වුණා වගේ.
(3) ඉඟුරු දී මිරිස් ගත්තා වගේ.
(4) වඳින්න ගිය දේවාලෙ ඉහේ කඩා වැටුණ වගේ.

**27.** තමාගේ ම වරදින් විනාශයක් කරා ළඟා වීම
(1) මාළුවා නැහෙන්නේ කට නිසා ලු.
(2) වත්ත බද්දට දී ඇස්සට දත නියවනවා ලු.
(3) කලක දි වහලු කලක දි රහ වෙනවා ලු.
(4) ඌරෝ කැකුණ තළන කොට හබන් කුකුළන්ට රජ මඟුල් ලු.

**28.** ද්විත්වරූප හා පරරූප සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) අද්දැකීම, සන්නස් (2) සන්නස්, අද්දැකීම
(3) පත්තිරු, අද්දැකීම (4) සන්නස්, පත්තිරු

[හතරවැනි පිටුව බලන්න.

Download all Past papers >> https://bookbeekid.com/resource/past-papers/

● අංක **29, 30** යටතේ දක්වා ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

**29.** (1) ශිෂ්‍ය-ශිෂ්‍යාවෝ උදෑසන ම පාසලට පැමිණ ඇත.
(2) සොර මුළ ධනය පැහැර ගනියි.
(3) ඈ ප්‍රසිද්ධ ලේඛිකාවක් වූවා ය.
(4) රජතුමා සිංහයෙක් සේ නිර්භීත විය.

**30.** (1) අම්මා හෝ තාත්තා රෝහලට යන්නේ ය.
(2) ගවයෝ කුඹුරු පාළු කරති'යි ගොවීහු චෝදනා කරති.
(3) තාරකාවන් බටහිර දිග අහසේ දිලිසෙති.
(4) ශිෂ්‍යයා ද තෝ ද පාසලට යති.

**31.** ● මේ මුදල් ආර්ථික සංවර්ධනය .............................. වැය කරන්න.
● දෙමාපියන් තම ඇස් දෙක .............................. රැක ගන්න.
● දරුවනි, උදෑසන 5ට .............................. අවදි වන්න.
● තම රට, ජාතිය .............................. අභිමානයක් ඇති කර ගන්න.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
(1) සඳහා, පමණ, ගැන, සේ (2) පමණ, ගැන, සේ, සඳහා
(3) සඳහා, සේ, පමණ, ගැන (4) ගැන, සේ, පමණ, සඳහා

**32.** පහත දක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"ඔහොම කීවාට ඒකි පොඩ්ඩක් වත් ඒ මිනිහට මනාප නෑ"
(1) එසේ ප්‍රකාශ කළ නමුත් ඇය ඒ පුද්ගලයාට කැමති නැත.
(2) මෙසේ කියූ නමුත් ඇය ඒ මිනිසාට කෙසේ වත් කැමති නැත.
(3) එසේ කියූව ද ඇය ඔහුට කැමැත්තක් නැත.
(4) එසේ කී නමුත් ඇය ඒ මිනිසාට මඳක් වත් කැමති නැත.

**33.** දළදා මාලිගාවේ කප් සිටුවීම සඳහා තෝරා ගන්නේ,
(1) කොස් ගසකි. (2) රුක්කත්තන ගසකි. (3) ඇසළ ගසකි. (4) බෝ ගසකි.

**34.** "බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් දසරාජ ධර්මයෙන් රාජ්‍ය පාලනය කරන කල්හි කසී දනව්වෙහි සී සා ජීවත් වන එක්තරා බමුණෙක් කුඹුරෙහි සී සා ගොන් ගේ මුදා හැර නියර කොටන්ට පටන් ගත්තේ ය." යන පාඨය ඇතුළත් වන්නේ,
(1) සද්ධර්මරත්නාවලියෙහි ය. (2) රාජාවලියෙහි ය.
(3) පන්සිය පනස් ජාතක පොතෙහි ය. (4) සද්ධර්මරත්නාකරයෙහි ය.

**35.** 'දිසි රනලියෙව් රූ සිරි යුත් මෙපුරඟන' යන පද්‍ය පාදයෙහි ඇතුළත් වන්නේ,
(1) උපමාලංකාරය යි. (2) රූපකාලංකාරය යි.
(3) ස්වභාවෝක්ත්‍යලංකාරය යි. (4) උත්ප්‍රේක්ෂාලංකාරය යි.

**36.** ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතා සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ශ්‍රී ලංකාවේ පුරාසික යුගය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ පුරාවිද්‍යාඥයා ය.
(2) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ නිර්මාතෘවරයා ය.
(3) පෙරසවි කොන්ක්‍රීට් තාක්ෂණය ලෝකයට හඳුන්වා දුන් ඉංජිනේරුවරයා ය.
(4) ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් හඳුන්වාදීමට ක්‍රියා කළ විද්වතා ය.

**37.** 'වගතුග' නම් තීරු ලිපි මාලාවේ රචකයා කවරෙක් ද?
(1) දයාසේන ගුණසිංහ (2) කුමාරතුංග මුනිදාස
(3) මහගම සේකර (4) ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ

**38.** කුඹුරු ගොවිතැනේදී 'වැදම' යනුවෙන් හඳුන්වන්නේ,
(1) ගොයම් කැපීමේදී භාවිත කරන දැකැත්ත යි.
(2) ගොයම් කපන අවස්ථාවේ පිරිනමන ආහාර යි.
(3) ගොයම් එකතු කිරීමට භාවිත කරන පැදුර යි.
(4) කමතේ දී සිදු කරන වතාවත් සඳහා භාවිත කරන පූජා භාණ්ඩ යි.

[පස්වැනි පිටුව බලන්න.

Download all Past papers >> https://bookbeekid.com/resource/past-papers/

39. "කසාද කාසිත් ගෙවපු නිසා ඉලන්දාරි ගෑනු ළමයගෙන් යමක් අහන්න තියෙනවා මට" හුනුවටයේ කතාවේ එන ඉහත ප්‍රකාශය කරන්නේ කවරකු ද?

(1) අසඩක් (2) ෂවුවා (3) සයිමන් සභාවා (4) නටාලියා

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

"සංස්කෘතියක් නියෝජනය කරන සහ නිරූපණය කරන ප්‍රධාන මෙවලම වන්නේ භාෂාව යි. ඊළඟ පරම්පරාවට සංස්කෘතිය ගෙන යන්නේ ද භාෂාව මගිනි. ඒ අනුව භාෂාව හා සංස්කෘතිය අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධතාවකි."

(1) භාෂාව හා සංස්කෘතිය අතර ඇති නොබිඳෙන සබඳතාවට සාක්ෂ්‍ය සපයන ප්‍රධාන සාධක වන්නේ භාෂාව මගින් සංස්කෘතිය නියෝජනය කිරීම සහ පරම්පරාවෙන් පරම්පරාවට සංස්කෘතිය ගෙන යන වාහකය භාෂාව වීම යි.

(2) සංස්කෘතියක් නියෝජනය කරන හා නිරූපණය කරන භාෂාව සංස්කෘතියේ වාහකය වන අතර භාෂාව හා සංස්කෘතිය අතර ඇත්තේ නොබිඳෙන සබඳතාවකි.

(3) සංස්කෘතියේ වාහකය භාෂාව වන අතර එනිසා ම භාෂාව මගින් සංස්කෘතිය නිරූපණය කිරීමත් නියෝජනය කිරීමත් නොබිඳෙන සබඳතාවක් පවත්වා ගැනීමත් සිදු කරයි.

(4) සංස්කෘතියේ නිරූපණයත් නියෝජනයත් සිදු කරන භාෂාව සංස්කෘතියේ වාහකයා වශයෙන් ද ක්‍රියාත්මක වේ.

* *



Download all Past papers >> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II
சிங்களமொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature I, II

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

※ ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් එක් එක් පිල්ල නියෝජනය කරන ස්වර අක්ෂරය ලියන්න.
(අ) කෙටි ඉස්පිල්ල
(ආ) ඇලපිල්ල

(ii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් නිපාතයක් සහ යුගල පදයක් උපුටා ලියන්න.
"ජීවිතයේ සැඳෑ සමය ගෙවන වැඩිහිටියන්ට අපි නිතර උදවු උපකාර කළ යුත්තෙමු."

(iii) පහත සඳහන් පද සන්ධි කර ලියන්න.
(අ) සිය + ඇසින් (ආ) සිති + කම්

(iv) පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන **දෙක** පමණක් නිදොස් කර ලියන්න.
මතකයේ රැඳෙන සහ ක්ෂනික ව අර්ථ ග්‍රහණය කළ හැකි පරිදි භාෂාව භාවිත කිරීම සාර්ථක දැන්වීම්කරනයේදී අත්‍යවශ්‍ය අංගයකි.

(v) පහත සඳහන් නාම පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කර ලියන්න.
(අ) වඳුරා (ආ) කපුටෝ

(vi) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් තද්ධිත පද **දෙකක්** ලියන්න.
රටේ දියුණුව වෙනුවෙන් දේශීය කර්මාන්ත නගා සිටුවීම කාලීන වශයෙන් ඉතා වැදගත් වේ.

(vii) පහත සඳහන් පද අයත් වන සමාස වර්ගය ලියන්න.
(අ) දිගුවරල
(ආ) අප්‍රමාණ

(viii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් කෘදන්ත පද **දෙකක්** ලියන්න.
ක්‍රීඩා උත්සවය නැරඹීම සඳහා පැමිණි ප්‍රේක්ෂකයෝ ක්‍රීඩාපිටිය වටා නැටුම් සන්දර්ශන ද පවත්වමින් ප්‍රීති වූහ.

(ix) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) නළුවන්, නිළියන් සමග වේදිකාවට අවතීර්ණ වූහ.
(ආ) ඔවුහු පුවත්පත් වාර්තාකරුවෝ මෙන් පෙනී සිටියහ.

(x) පහත සඳහන් වාක්‍ය කර්තෘකාරකයට හරවන්න.
(අ) වෛද්‍ය ශිෂ්‍යයන් විසින් රෝගීහු නිරීක්ෂණය කරනු ලබති.
(ආ) සේවකයන් විසින් ආයතන ප්‍රධානියාට උපහාර උත්සවයක් සංවිධානය කරන ලදි.

(ලකුණු 02 × 10 = 20 යි.)

[හත්වැනි පිටුව බලන්න.

Download all Past papers >> https://bookbeekid.com/resource/past-papers/

**2.** පහත දැක්වෙන **(අ)**, **(ආ)**, **(ඉ)**, **(ඊ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

**(අ)** ලෝකයේ බොහෝ රටවල් ආර්ථික සංවර්ධනය කරා ළඟා වීමේදී නිෂ්පාදන ආර්ථිකය කෙරෙහි ද ප්‍රමුඛ අවධානයක් යොමු කර ඇත. ඒ අයුරින් ශ්‍රී ලංකාව ද නිෂ්පාදන ආර්ථිකය නගා සිටුවීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු ව ඇත. මෙහිදී යටිතල පහසුකම් සංවර්ධනය, මානව සම්පත් සංවර්ධනය, විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීම, කාර්මික හා තාක්ෂණික කර්මාන්ත සංවර්ධනය ආදිය ශක්තිමත් නිෂ්පාදන ආර්ථිකයකට පදනම සපයනු ඇත. ඒ වෙනුවෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සක්‍රිය දායකත්වය ද අඛණ්ඩ ව ලැබිය යුතු ය.

**(ආ)** පොලිතීන් ආශ්‍රිත ද්‍රව්‍ය අධික ලෙස පරිසරයට එක්වීම නිසා පාරිසරික හා සමාජ ගැටලු රැසක් පැන නැඟී ඇත. මේ සඳහා ශ්‍රී ලංකාවේ විවිධ පාර්ශ්ව වෙතින් බොහෝ විසඳුම් ද ඉදිරිපත් වනු නිරීක්ෂණය කළ හැකි ය. එම විසඳුම්වල ප්‍රායෝගික භාවිතය පිළිබඳ පුළුල් සමාජ සාකච්ඡාවක් ඇති වී තිබීම ද වගකිව යුතු පාර්ශ්වවල අවධානයට ලක්විය යුත්තකි. කෙසේ වුවත් පොලිතීන් වෙනුවට පරිසර හිතකාමී ආදේශක භාවිතය ප්‍රවර්ධනය, හා විධිමත් ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලි නිසි පරිදි සිදු කිරීම ආදියෙන් බොහෝ අතිරේක වාසි ද හිමි වේ.

**(ඉ)** වර්තමානයේ ශ්‍රී ලංකාවේ රිය අනතුරු බහුල ව සිදු වන අතර එය මේ වන විට සමාජ ඛේදවාචකයක් බවට පත් වී ඇත. රියැදුරන්ගේ නොසැලකිලිමත් බවට අමතර ව තවත් හේතු සාධක රැසක් ද මේ සඳහා බලපායි. මෙයට විසඳුමක් ලෙස ප්‍රථමයෙන් දැනුමෙන් හා ආකල්පවලින් පොහොසත් පුහුණු රියැදුරු ප්‍රජාවක් බිහි කර ගැනීමට වැඩපිළිවෙළක් සකස් කළ යුතු ය. එසේ ම රිය අනතුරු වළක්වා ගැනීම සඳහා මගීන්ගේ දායකත්වය ද සුළු කොට තැකිය නොහැකි ය. රථවාහන නීති බලාත්මක කිරීමට අමතර ව රිය අනතුරු කළමනාකරණය හා වළක්වා ගැනීම ආදිය සම්බන්ධයෙන් වගකිව යුතු අංශවල දායකත්වය ද අඛණ්ඩ ව ලැබිය යුතු ය.

**(ඊ)** කුඩා අවධියේ සිට ම පොත්පත්වලට නිරාවරණය වීම සහ දිගුකාලීන අධ්‍යාපන සාර්ථකත්වය අතර ධනාත්මක සහසම්බන්ධතාවක් පවතින බවට නූතන පර්යේෂණවලින් සොයා ගෙන ඇත. ඒ සඳහා ලබා දිය හැකි දේශීය හා විදේශීය උදාහරණ ද රැසකි. පොත් කියවීමේ කුසලතාව අඛණ්ඩ ව පුහුණු කළ විට අත් වන ප්‍රයෝජන ද අසීමිත ය. එහෙත් සමාජ මාධ්‍ය භාවිතයේ අධිකතර බව නිසා පොත් කියවීමේ පුරුද්ද ගිලිහී යමින් පවතින බවට මතවාද ඉදිරිපත් වී තිබේ. තාක්ෂණික දියුණුවත් සමග ම පොත් කියවීමේ කුසලතාව සංවර්ධනය කිරීමේ අභියෝගය ජය ගැනීමට විධිමත් උපාය මාර්ග සෙවිය යුතු ය.

(ලකුණු 25 යි.)

**3.** පහත දැක්වෙන පාඨය වචන **65 - 75** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

පරිපාලනය විශ්ව ව්‍යාප්ත ක්‍රියාවලියක් ලෙස සැලකුණ ද එය පහසුවෙන් අවබෝධ කර ගත හැකි ක්‍රියාවලියක් නො වේ. එමෙන් ම ඇතැමෙකුට එය අනවශ්‍ය ක්‍රියාවලියක් වශයෙන් අර්ථකථනය කළ හැකි වුව ද සෑම නූතන සමාජයක ම අනිවාර්යයෙන් ම පැවතිය යුතු ක්‍රියාවලියක් බවට පත් ව ඇත. කෙසේ වුව ද පරිපාලනය යනුවෙන් හැඳින්වෙනුයේ මිනිස් වැඩ කටයුතු නිසි පරිදි කළමනාකරණය කිරීම වේ. මානවයා ප්‍රභවය ලත් වකවානුවේ සිට ම මේ ක්‍රියාවලියේ ආරම්භය සිදු වී ඇත. මුල් ම අවධිවල ගෝත්‍රික නායකයන්ට පැවරී තිබුණේ මේ කාර්යභාරය යි. නූතන සමාජයේ පවතින කවර මාදිලියක හෝ ආයතනයක ප්‍රධානියා විසින් සිදු කරනු ලබන්නේ ද මේ ක්‍රියාවලිය ම ය.

නූතන සමාජයේ පරිපාලන ක්‍රියාවලියට අයත් වන සමාජ කාර්යභාරයන් සහ සංකීර්ණ සංවිධාන ව්‍යුහය දෙස බලන විට පැහැදිලි වනුයේ ඒවා යම් සමාජ අරමුණක් ඉටු කර ගැනීමේ පරමාර්ථයෙන් සකස් කර ඇති බව යි. මෙහි පළමු පියවර වන්නේ ඒ ඒ සමාජ කාර්යභාරයන් හඳුනා ගැනීම යි. දෙවන පියවර වන්නේ ඒවා පිළිවෙළකට සංවිධානය කිරීම සහ සම්බන්ධීකරණය යි. අවසන් පියවර වන්නේ ඒවා ක්‍රියාත්මක කිරීම යි. මේ ක්‍රියාවලියට පුද්ගල සමූහයකගේ දායකත්වය අවශ්‍ය වේ. ඕනෑ ම මානව සමාජයක යහපැවැත්ම උදෙසා මේ පරිපාලන ක්‍රියාවලිය බෙහෙවින් ම වැදගත් වේ. රටක මානව සම්පත් සංවර්ධනය හා භෞතික සම්පත් සංවර්ධනය ඍජු ව ම මේ පරිපාලන ක්‍රියාවලිය හා බද්ධ ව පවතී. මෙරට සාම්ප්‍රදායික පරිපාලන ව්‍යුහය පිළිබඳ සලකා බැලීමේදී වරිග සභා, ගම් සභා සහ රට සභා වැනි ඒකකවලින් සිදු ව ඇත්තේ ද මේ කාර්යභාරය ම බව හඳුනාගත හැකි ය. ඒ අනුව පරිපාලන ක්‍රියාවලිය ඕනෑ ම රටක අතීතයේ සිට වර්තමානය දක්වා අඛණ්ඩ ව ක්‍රියාත්මක වෙමින් පවතින ක්‍රියාවලියක් බව පැහැදිලි ය.

(ලකුණු 10 යි.)

[අටවැනි පිටුව බලන්න.

Download all Past papers >> https://bookbeekid.com/resource/past-papers/

**4.** පහත දැක්වෙන පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට **පිළිතුරු** සපයන්න.

ලංකාවේ නිෂ්පාදනයන්ගෙන්, ඉන්දියාවේදී අලෙවි කළ හැකි වූයේ, අලි ඇතුන්, පුවක්, සක් බෙල්ලන් සහ මුතු පමණ ය. ලංකාවේ සංඛ්‍යාත්මක ව විශාල ප්‍රමාණයක් වූ අලි ඇතුන් විකිණීමෙන් මහත් ආදායමක් ලබා ගත හැකි විය. දිවයින අභ්‍යන්තරයෙහි, ජනාවාස වල්බිහි වී වනාන්තරය පැතිරී යාම නිසා ඇතුන්ගේ ගණන ඉතා විශාල වශයෙන් වැඩි වී ගොස් තිබුණු අතර මේ කාලයේදී මහත් ආයාසයක් නොමැති ව ඔවුන් අල්වා ගෙන හීලෑ කිරීමට හැකි විය. ඉතා දක්ෂ උපායකින්, අලි ඇතුන් ඇල්ලීම ගැන විශේෂඥ නිපුණතාවක් ඇති ව සිටි එක්තරා කුලයකට අයත් මිනිස්සු කොටසක් සිටියහ. ඉන්දියානු රජවරුන් යුද්ධ කටයුතු, බර ඇදීම සහ ස්වකීය කකුධ භාණ්ඩවල එක් අංගයක් වශයෙන් ද පාවිච්චි කිරීම සඳහා අලි ඇතුන් ලබා ගැනීමට උත්සාහ කිරීම නිසා ඔවුන් උදෙසා ඉන්දියාවේ වෙළෙඳපොළක් තිබුණේ ය. විශේෂයෙන් ම උතුරු ඉන්දියාවේ ප්‍රබල රජවරුන් අතර ඇතුන් සඳහා විශාල ඉල්ලුමක් තිබුණේ ය. ප්‍රමාණයෙන් ඉතා විශාල වීමත්, තැනින් තැන ගෙන යාම ඉතා අපහසු වීමත් නිසා ඉන්දියාවේදී ඔවුන් සඳහා අධික මිලක් ලබා ගත හැකි විය. ඉන්දියාවත් සමග ලංකාව ගෙන ගිය මේ ඇතුන් වෙළෙඳාම ඉතා පැරණි එකක් වූ අතර, එය පටන් ගන්නා ලද්දේ, නැගෙනහිර ලෝකයේ යුරෝපීය වෙළෙඳාමට බොහෝ කලකට පෙර ය.

පුවක් වූ කලී, මීට වඩා බෙහෙවින් වෙනස් වූ වෙළෙඳ භාණ්ඩයක් විය. එහි ප්‍රධාන ලක්ෂණය වූයේ, එයට තිබූ ඉතා විශාල වූ ඉල්ලුමත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් එයට තිබූ පෘථුල වෙළෙඳපොළත් ඉල්ලුමට සම වන අන්දමින් එය සුලභ ව තිබීමත් ය. තාල වර්ගයට අයත්, පුවක් නමින් හැඳින්වෙන ගස් වර්ගයක හට ගන්නා ගෙඩි වර්ගයක් වූ එය දිවයිනේ සැම පළාතක ම, සැම ගෙවත්තක ම පාහේ වැවෙන ගස් වර්ගයකි. මෙම ගෙඩි වර්ගය, සාමාන්‍යයෙන් ලංකාවේත් ඉන්දියාවේත් ජනයා විසින් බුලත් සමග විට කෑම සඳහා ප්‍රයෝජනයට ගනු ලැබිණි.

(i) ලංකාවට විශාල ආදායමක් උපයා ගත හැකි වූයේ කවර සතුන් විකිණීමෙන් ද?

(ii) දක්ෂ උපාය යොදමින් අලි ඇතුන් ඇල්ලීමෙහි නිරත වූවෝ කවරහු ද?

(iii) ඉන්දීය රජවරුන් අලි ඇතුන් පාවිච්චි කිරීමට බලපෑ හේතු කීයක් මෙහි දැක්වේ ද?

(iv) අලි ඇතුන් සඳහා විශාල ඉල්ලුමක් පැවතියේ කවර රජවරුන් අතර ද?

(v) පුවක් අයත් වන්නේ කවර වර්ගයේ ශාක විශේෂයකට ද?

(ලකුණු $02 \times 5 = 10$ යි.)

**5.** වැසි සමයෙන් අනතුරු ව බෝ වන රෝගවලට ගොදුරු වීම සිතුම්පුර ජනතාව නිරන්තරයෙන් මුහුණ දෙන ගැටලුවකි. ඒ පිළිබඳ ව ඔවුන් දැනුවත් කිරීමට සුදුසු අත්පත්‍රිකාවක් සකස් කරන්න. අත්පත්‍රිකාවට පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය.

- බෝ වන රෝග ඇති වීමට හේතු
- එයින් මිදීමට ගත හැකි ක්‍රියාමාර්ග
- ජනතාව වෙත ලබා දෙන උපදෙස්
- ජනතාවගෙන් අපේක්ෂා කරන සහාය

සිතුම්පුර ප්‍රාදේශීය සෞඛ්‍යාරක්ෂණ කමිටුවේ ලේකම් රවිඳු ජයශාන්ත ඔබ යයි සිතන්න.

**නැතහොත්**

සාරගම විද්‍යාදීප විද්‍යාලයේ කලා සංගමය මගින් චිත්‍ර ප්‍රදර්ශනයක් පැවැත්වීමට සැලසුම් කර ඇත. ඒ සඳහා චිත්‍ර ඉදිරිපත් කිරීමට සිසුන් දැනුවත් කිරීම සඳහා සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න. කලා සංගමයේ ලේකම් රවිඳි වරුසමාන ඔබ යයි සිතන්න. දැන්වීමෙහි පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය.

- චිත්‍රවල තේමාව
- භාවිත කළ හැකි මාධ්‍ය
- චිත්‍රවල ප්‍රමාණය
- භාර දිය යුතු දිනය

(ලකුණු 15 යි.)

* * *

Download all Past papers >> https://bookbeekid.com/resource/past-papers/

282874

OL/2025(2026)/21/S-III

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 S III**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

**සිංහල භාෂාව හා සාහිත්‍යය III**
சிங்களமொழியும் இலக்கியமும் III
Sinhala Language and Literature III

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

**වැදගත් :** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.
* **1, 2, 3, 4** ප්‍රශ්නවලටත්, **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) කඳු බැවුමක දං - බෝවිටි පඳුරු  ත ලා
පහළට ඇදී පර මල් පෙති ඉවත  නො ලා
**කලදෝ දියෙන් පොගවා රන් පුලින  ත ලා**
සංගීතවත් වී යම් ඉදිරියට  ග ලා

(අ) මේ පද්‍යය ඇතුළත් කාව්‍ය නිර්මාණයේ නම ලියන්න.
(ආ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ අදහස කුමක් ද?

(ii) "නිවෙසේ දී නැවත වරක් තම රූප සෞන්දර්යය ආස්වාදනය කිරීමේ අටියෙන් කැටපත ඉදිරියට ගිය ඈ, තම පොරෝනය ඉවත් කළා ය. එකෙණෙහි ම ඈ මහ හඬක් නැඟුවා ය."

(අ) මෙහි සඳහන් තැනැත්තිය මහ හඬක් නැඟීමට හේතුව කුමක් ද?
(ආ) මේ උද්ධෘතය ඇතුළත් නිර්මාණයේ කතුවරයා නම් කරන්න.

(iii) පහත දැක්වෙන කවියේ ඉතිරි පද **දෙක** සම්පූර්ණ කරන්න.

අග පිපි මල් මලිගිය ලිය  කැලේයා
වග බැඳැ හෙන රජ හස පුල්  විලේයා

(අ) ..........................................................................................

(ආ) ..........................................................................................

(iv) "එසේ හෙයින් කල් නොයවා යහපත් නැකැතෙකින් වහා නික්මුණු මැනැවැ."

(අ) මේ ප්‍රකාශය කළේ කවරෙක් ද?
(ආ) උක්ත ප්‍රකාශයෙන් අනතුරුව ඔවුන් නික්ම ගියේ කුමක් සඳහා ද?

(v) "හිර ගෙදරින් අහපුවාම, උඹට දැන ගන්ඩ පුළුවන් වෙයි."

(අ) මේ ප්‍රකාශය කළේ කවරෙක් ද?
(ආ) මෙහි '**දැන ගන්ඩ පුළුවන් වෙයි.**' යනුවෙන් ප්‍රකාශ වන්නේ කුමක් ගැන ද?

(vi) මිහ'ඹ මුව මඬල මෙන් දිලෙන හැම  විට
දුලබ ඉසුරු පිරි සැදි ඒ වෙහෙර  සිට
කිරඹ පොකුරු මී රස ලැබ බොන  ලෙසට
නරඹ මිතුර තගෙ නෙත සිත සතුටු  කොට

(අ) මෙහි සඳහන් වන වෙහෙර හැඳින්වූයේ කුමන නමකින් ද?
(ආ) '**මිහිකත**' යන්න සඳහා මෙහි යෙදී ඇති වචනය කුමක් ද?

[දෙවැනි පිටුව බලන්න.

Download all Past papers >> https://bookbeekid.com/resource/past-papers/

(vii) රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩ ගිනි නැද්ද
**මිණි බරණින් සැදු මුත් ගත නොදිරද්ද**
පැණිවරකා ගසටත් හෙණ නොවදිද්ද
(අ) තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය ලියන්න.
(ආ) යහපත් දෙයකට වුවත් අයහපතක් සිදු විය හැකි බව ඇඟවෙන පද්‍ය පාදය උපුටා දක්වන්න.

(viii) "ම දුව විකුණන්නා නැත. රන් හැර ගෙන නො දෙමි. අපටත් රක්ෂාව නම් ඌ ම වෙ ද?"
(අ) මේ ප්‍රකාශය කළේ කවරකු ද?
(ආ) මේ ප්‍රකාශය ඇතුළත් කෘතිය අයත් වන්නේ කුමන යුගයකට ද?

(ix) "මහත් වූ කෝලාහල ශබ්දයෙක, අපි කුමක් බවත් නො දනුම්හ.'කුමන අරගලයෙක් දැ' යි විමසුව හොත් යහපතැ"
(අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ආ) මෙහි සඳහන් පරිදි මහත් වූ කෝලාහල ශබ්දයක් ඇති වීමට හේතුව කුමක් ද?

(x) (අ) පැරණි ම සිංහල සිවුපද කාව්‍ය ග්‍රන්ථ ලෙස සැලකෙන සන්දේශ කෘති **දෙක** නම් කරන්න.
(ආ) '**පූජාවලිය**' කෘතියේ කතුවරයා කවරෙක් ද?

(ලකුණු 02 × 10 = 20 යි.)

2. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) සිදු වූ පුවත අනාවරණය කරන ලෙසා
දෙදෙනා කැඳවා ගෙන කීවා තතු මෙලෙසා
(අ) මෙහි සඳහන් දෙදෙනා හැඳින්වූයේ කවර නම්වලින් ද?
(ආ) මෙහිදී අනාවරණය කෙරුණු පුවත කෙටියෙන් විස්තර කරන්න.

(ii) "කනක රජතාදීන් විචිත්‍ර වූ රක්ත නීලාදි වූ නානා වස්ත්‍රයෙන් සමුජ්වලිත රථාදියෙහි නඟන ලද නා නා ප්‍රකාර **ධවලච්ඡත්‍ර** පංක්තියෙන් ගැවැසී ගත්තී ය. ඇත් වාහන, අස් වාහන රථ වාහනයෙන් යුක්ත ය. හස්ති ශිල්ප යැ, අශ්ව ශිල්ප යැ, රථ ශිල්ප යැ, ධනුශ්ශිල්ප යැ ආදි වූ අටළොස් මහා ශිල්පයෙහි කෙළ පැමිණියන් විසින් විශේෂයෙන් **සමෘද්ධ ය**. මේ සේනා තොමෝ සිංහ සමාන වික්‍රම ඇත්තී ය."
(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.
(ආ) යුද්ධ සේනාව වර්ණනා කර ඇති ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(iii) පිය සත් නො ව බිඟු දැල් රැඳි කොපුලී
අවසන් නො ව වෙණ නදට ම **කුහුලී**
මද සන් සුන් පියොවින් සිටි නොසැලී
ගජ සෙන් සිතියම් ගජ සිරි **කියෙලී**
(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.
(ආ) වීණා නාදයට ලොල් වූ ඇතුන්ගේ හැසිරීම් රටාව කෙටියෙන් විස්තර කරන්න.

(iv) නිල තුරඟුට නැඟෙමින් රිවි දෙව් සිරින
**දුල කැරු** සේසත් මිණි බරණ **කිරණින**
බල පිරි සෙන් සහ යාපා පටුන් ගෙන
බල සේනානායක සපු කුමරු එන
(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.
(ආ) මුළු පද්‍යයේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

[තුන්වැනි පිටුව බලන්න.

Download all Past papers >> https://bookbeekid.com/resource/past-papers/
0007353

(v) "මම් යන්නට නො නිස්සෙමි. සතර දෙනකු කෙරෙහි විස්වස් නැතිඃ සොර 'පෙරැ මා සබඳහ' යි විස්වස් නොකට යුත්තෙ යැ. තමා පළමු අතොට හුන් කොළ 'මා පෙර වළඳ ගත්තෙ යැ' යි විස්වස් නොකට යුත්තෙ යැ. රජ 'මා හා සබඳහ' යි විස්වස් නොකට යුත්තෙ යැ. ස්ත්‍රී 'මට වශ්‍ය යැ'යි විස්වස් නො ද කට යුත්තෙ යැ' යි කී යැ."

(අ) මේ ප්‍රකාශය කවුරුන් විසින් කාහට කරන ලද්දක් ද?

(ආ) මෙහි සඳහන් වන පරිදි විශ්වාස නොකළ යුතු අවස්ථා හතර පැහැදිලි කරන්න.

(ලකුණු 04 × 5 = 20 යි.)

3. මියුලු නුවර යටත් කර ගැනීම සඳහා,

- කේවට්ට බමුණා යෙදූ උපක්‍රමත්
- මහෞෂධ පඬිතුමා එම උපක්‍රම ව්‍යර්ථ කළ ආකාරයත්

පාඨක සිත්වල වාක් චිත්‍ර මැවෙන ආකාරයෙන් ඉදිරිපත් කිරීමට කතුවරයා සමත් වී ඇති අයුරු 'උම්මග්ග ජාතකයේ' නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

- ජීවමාන ලෙස අවස්ථා නිරූපණයත්
- අවස්ථෝචිත ලෙස චරිත වෙනස් කිරීමත්

'ගුත්තිල කාව්‍යයේ' සාර්ථකත්වයට හේතු වී ඇත. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි.)

4.
- සිහින ලෝකයක ජීවත් වීමේ ව්‍යාජත්වයත්
- සැබෑ ලෝකයේ පවතින යථාර්ථයත්

'දියමන්ති මාලය' කෙටිකතාවෙන් මතු කෙරෙන සනාතන පණිවිඩය යි. මැටිල්ඩාගේ චරිතය ඇසුරින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

- උපයුක්ත භාෂාවේ සුමට බවත්
- අවස්ථා පෙළ ගැස්වීමේ නිපුණත්වයත්

හේතුවෙන් පාඨක සිත් අමන්දානන්දයට පත් කිරීමට 'සිංහබාහු' නාට්‍යය සමත් ව ඇති අයුරු නාට්‍ය පෙළ ඇසුරින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි.)

- 5, 6, 7 ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

5. තුගත් ගැමි ජනයා සෞඛ්‍ය පුරුදු කෙරෙහි නැඹුරු කරවීමට වගකිවයුතු නිලධාරීන් ගන්නා වූ වෙහෙස 'අපට වැසිකිළියක්' කෙටිකතාවෙන් පැහැදිලි වෙයි. මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ චරිතය ඇසුරින් උදාහරණ **තුනක් වත්** දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි.)

6. 'දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල' පද්‍ය නිර්මාණය පුද්ගල චරිත සංවර්ධනයට පිටුබලයක් ලබා දෙන පද්‍යවලින් පෝෂිත ය. නිර්දිෂ්ට පද්‍ය ඇසුරින් උදාහරණ **තුනක් වත්** දක්වමින් විමසන්න.

(ලකුණු 10 යි.)

7. 'භද්‍ර යෞවන වියේදී විවාහය සම්බන්ධයෙන් උග්ගසේනයන් ගත් වැරදි තීරණය ඔහුගේ අනාගතය නව සන්ධිස්ථානයක් කරා ගෙන යාමට හේතු විය.' නිර්දිෂ්ට කථා වස්තුවෙන් උදාහරණ **තුනක් වත්** දක්වමින් විමසන්න.

(ලකුණු 10 යි.)

* * *

Download all Past papers >> https://bookbeekid.com/resource/past-papers/